Human Rights Commission of Sri Lanka
Library
No. 165, Kynsey Road,
Colombo 08.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2016-01-07

පැමිණිලිකාරිය : ඉරේෂා ප්‍රසාදනී අබේනායක මිය,
47/14 බී, මෙන්ඩිස් වෙද මාවත,
තල්පිටිය උතුර, වාද්දුව.

වගඋත්තරකරුවන් :
01. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. අධ්‍යක්ෂක (ජාතික පාසල්)
ජාතික පාසල් අංශය,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

03. විදුහල්පති,
ශ්‍රී සුමංගල විද්‍යාලය,
පානදුර.

පැමිණිලි අංක : **HRC/2694/15**

ඉහත අංකය යටතේ ගොනු කරන ලද පෙත්සමට අදාළව පරීක්ෂණ කටයුතු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ සිදු කළ පසු පෙත්සමේ සඳහන් සියළු කරුණුද වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම්ද පරීක්ෂණ අවස්ථාවලදී ඉදිරිපත් කළ කරුණුද සලකා බලා පහත සඳහන් අවසන් නිර්දේශය ඉදිරිපත් කරමින් ඒ අනුව පියවර ගන්නා ලෙස වගඋත්තරකරුවන්ට මින් දන්වා සිටිනු ලැබේ.

**පෙත්සමේ සඳහන් කරුණු :-**

පෙත්සම්කරුගේ දරුවා වන බිනුක් බාසික කස්ත්‍රිආරච්චි යන අය පානදුර ශ්‍රී සුමංගල විද්‍යාලයේ පිරිමි පාසලේ 2015 වසරට 2 ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා පෙත්සම්කාරිය විසින් ඉල්ලීමක් සිදු කර අයදුම්පතක් ඉදිරිපත් කළ පසු ඒ පිළිබඳ සලකා බලා විදුහල්පති විසින් අදාළ ශ්‍රේණියේ පවතින ඇබෑර්තු මත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා තෝරා ගන්නා ලද ළමුන් ඇතුළත් කර ගැනීම සඳහා



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 165, කිංසි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
සභාපති / தவிசாளர் / Chairman: 2696470
ෆැක්ස් / தொலைநகல் / Fax: 2694924
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2694925, 2685980, 2685981
ලේකම් / செயலாளர்: 2689558
ක්ෂණික / துரித அழைப்பு: 2689064
වෙබ් / இணையம்

අනුමැතිය ලබා දී ඇති නමුත් 01 වන සහ 02 වගඋත්තරකරුවන් විසින් ඒ සඳහා අවශ්‍ය නිර්දේශය ලබා නොදීම මත පෙත්සම්කාරියට අසාධාරණයක් වූ බවද තම දරුවා පාසලට ඇතුළත් කිරීමට ඇති අයිතිවාසිකම අහිමි කර ඇති බවද කියාපාමින් මෙම පෙත්සම ගොනු කර ඇත. තවද, ශ්‍රේණිවල පවතින පුරප්පාඩු සලකා බලා ළමුන් කිහිපදෙනෙකු බඳවා ගැනීමට හැකියාවක් තිබූ බැවින් විදුහල්පති විසින් ඒ අනුව ළමුන් කිහිපදෙනෙකු බඳවා ගැනීමට හැකි බව සුදුසුකම් පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව නිකුත් කළ අනුමැතිය සටහන් ලේඛනයේ දක්වා ඇතත් විදුහල්පති විසින් අනුමැතිය ලබා නොදුන් දරුවෙකු සහ අනුමැතිය දී ඇති ළමුන්ගෙන් එක් අයෙකු පමණක් ඇතුළත් කර තිබීමෙන් පෙත්සම්කාරියගේ දරුවාගේ අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවද අදාළ පාසලේ 2 වන ශ්‍රේණියට තම දරුවාට ඇතුළත් වීමට ඇති අවස්ථාව අහිමි කර වගඋත්තරකරුවන් වෙනත් දරුවන් පාසලට ඇතුළත් කිරීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් යටතේ දක්වා ඇති 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇති බවද දක්වා ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

පෙත්සමට අදාළව වගඋත්තරකරුවන් වෙතින් වාර්තා කැඳවීමක් සිදු කර ඇති අතර, ඒ අනුව 2015.08.24 දින 03 වන වගඋත්තරකරු වන ශ්‍රී සුමංගල විද්‍යාලය විසින් එවා ඇති වාර්තාවේ දක්වා ඇති පරිදි 2015 වර්ෂය සඳහා 2 වන ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා ඉල්ලුම්පත් 32 ක් ලැබුණු බවද ඉල්ලුම්පත් ඉදිරිපත් කළ සියලු දෙනාම 2015.02.25 වන දින සම්මුඛ පරීක්ෂණයට කැඳවූ පසු පවතින පුරප්පාඩු අනුව එක් ශ්‍රේණියක 45 සීමාව යටතේ සිසුන් ඇතුළත් කිරීමට ඇති හැකියාව සලකා බලා තෝරා ගත් ළමුන් පිළිබඳ ලේඛනය නිර්දේශ කොට 01 වන වගඋත්තරකරුට යවන ලද බව දක්වා තිබේ.

පෙත්සම්කාරියගේ දරුවාද නිර්දේශ කරන ලද නාම ලේඛනයේ අනුමැතිය සඳහා නම් කර තිබූ බවද එකී ලේඛනයේ හත්දෙනෙකුගේ නම් නිර්දේශ කර යවා තිබූ බවද ඉන් නම් තුනක් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවය කරන නිලධාරීන්ගේ දරුවන් බවද පෙන්වා දී ඇති අතර, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පවත්වන ලද අභියාචන පරීක්ෂණ කිරීමට අදාළ විශේෂ කමිටුවක් මගින් තෝරා ගන්නා ලද දරුවන් ඇතුළත් කිරීමට නම් කර තිබීම මත පෙත්සම්කාරියගේ දරුවා ඇතුළත් කිරීමට 01 වන වගඋත්තරකරු අනුමත නොකළ බැවින් හැකියාවක් නොලැබුණු බව පෙන්වා දී ඇත.

02 වන වගඋත්තරකරු විසින් යොමු කරන ලද 2015.10.16 දිනැති වාර්තාවට අනුව 2015 වසරේ අතරමැදි ශ්‍රේණි වලට සිසුන් ඇතුළත් කිරීමේදී ප්‍රධාන වශයෙන් සලකා බලන ලද්දේ 2015.02.09 දිනැතිව ප්‍රධාන පුවත්පත් මගින් පළ කරන ලද දැන්වීමට අනුව කටයුතු කිරීම මත බවද අමාත්‍යාංශයට යොමු කරන ලද අභියාචනා පමණක් සලකා බලන බවද, බොහෝ ජාතික පාසල් වල විදුහල්පතිවරුන් විසින් එවා තිබූ නිර්දේශිත නාම ලේඛන 2008/38 අංක දරණ චක්‍ර ලේඛනය එනම් අතරමැදි ශ්‍රේණි වලට සිසුන් බඳවා ගැනීමේ චක්‍ර ලේඛය ප්‍රකාරව සලකා බලා සකස් කර නොතිබීම

මත මෙම පියවර ගැනිමට සිදු වී ඇති බවද දක්වා ඇත. විදුහල්පති විසින් ඒවා තිබූ නාම ලේඛනයට අනුමැතිය ලබා නොදුන් බව ඉන් දක්වා ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-**

මෙම පැමිණිල්ලට අදාළව 2015.09.22 දින පැවැති මුල් පරීක්ෂණ අවස්ථාවේදී වගඋත්තරකරුවන් දන්වා ඇත්තේ 40 ක සීමාව අභිබවා සිසුන් ඇතුළත් කර ගෙන නොමැති බවත්, පාසලට ඇතුළත් වීමට අනුමැතිය ලබා දී ඇති සිසුන් අධ්‍යාපන අමාත්‍යාංශය තුළ හෝ අධ්‍යයන කාර්ය මණ්ඩල වල සේවය කරන අයගේ දරුවන් ඇතුළත් කිරීමට දන්වා ඇති බවද වේ. මෙම කරුණු තහවුරු කර ගැනිමට 03 වන වගඋත්තරකාර විද්‍යාලයෙන් 2015 වසරේ 2 ශ්‍රේණියේ ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ වාර්තාවක් කැඳවා තිබූ අතර එහිදී එය 2015.10.16 දින කොමිෂන් සභාවට ලබා දී තිබිණ. එය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| 2A | - | 47 |
| 2B | - | 45 |
| 2C | - | 45 |
| 2D | - | 44 |
| 2E | - | 44 |
| 2F | - | 44 |

අනතුරුව 2015.10.16 දින පැවැති වැඩිදුර පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කළ කරුණු අනුව පහත සඳහන් කරුණු අනාවරණය වී ඇත.

අතරමැදි ශ්‍රේණි සඳහා ළමුන් බඳවා ගැනිමට පවතින චක්‍ර ලේඛය වන්නේ 2008/38 චක්‍රලේඛය පමණක් වන අතර, වෙනත් නිතිමය ක්‍රමවේදයක් නොමැති බව අනාවරණය වේ. පාසලේ 2 ශ්‍රේණියේ පැවැති පුරප්පාඩු සලකා බලා 45 සීමාවට යටත්ව සිසුන් හත්දෙනෙකු ඇතුළත් කිරීමට ඇති හැකියාව පිළිබඳව දක්වා ලද අයදුම්පත් සලකා විදුහල්පති විසින් සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගන්නා ලද ළමුන්ගේ නාම ලේඛනය එකී චක්‍රලේඛයට අනුව ඉදිරිපත් කළ පසු 01 වන වගඋත්තරකරු විසින් නිර්දේශ නොකල බව 03 වන වගඋත්තරකරු විසින් දන්වා ඇත.

විශේෂ අභියාචනා කමිටුවක් මගින් විදුහල් වල ශ්‍රේණි වලට ළමුන් ඇතුළත් කිරීමට ඉදිරිපත් කළ අභියාචනා සලකා බලා ශ්‍රී සුමංගල විද්‍යාලයේ 02 වන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කළ යුතු ආකාරයද 01 සහ 02 වගඋත්තරකරුවන් විසින් පෙන්වා දී තිබූ බව එහිදී සඳහන් කර ඇත. ඒ අනුව කමිටුව පිහිටුවා ඇත්තේ අමාත්‍යාංශය වෙත ලැබෙන අභියාචනා සලකා බැලීමට බවද 2015.02.15 වන දින

ප්‍රසිද්ධ පුවත්පත් මගින් දැන්වීමක් නිකුත් කර මාර්තු මස 06 වන දිනට පෙර අසාධාරණයට ලක් වූ දරුවන්ගේ අභියාචනා සලකා බැලීමට ඉදිරිපත් වන ලෙස දක්වා තිබූ බවද පෙන්වා දී ඇති අතර පෙත්සම්කාරිය දන්වා ඇත්තේ, විදුහල විසින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වා තම දරුවා පාසලට ඇතුළත් කිරීමට තෝරා ගෙන තිබූ ලැයිස්තුවේ දරුවාගේ නම තිබූ බැවින් අසාධාරණයක් සිදු වී නොතිබීම මත අභියාචනයක් කිරීමේ අවශ්‍යතාවයක් නොතිබීමේ හේතුව මත එවැනි ඉල්ලීමක් සිදු නොකළ බවද පසුව අමාත්‍යාංශය විසින් විදුහල විසින් තෝරා ගත් ලැයිස්තුව ප්‍රතික්ෂේප කළ බව දැන ගන්නා විට එකී කමිටුව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට තිබූ කාලයද ඉකුත්ව ගොස් තිබූ බවද වේ.

චක්‍රලේඛයෙන් බාහිරව ළමුන් එක් ශ්‍රේණියකට 40 කට වඩා ඇතුළත් කිරීමට කමිටුව තීරණය කරන්නේ කුමන හේතුන් මතද යන්න විමසා සිටීමේදී 01 වන සහ 02 වන වගඋත්තරකරුවන් දන්වා ඇත්තේ, එය ලේකම්වරයාගේ ඇති අභිමතයක් බවත් සාධාරණ හේතු සලකා බලා සුදුසු පියවර ගන්නා බවත්ය. අභියාචනා කමිටුවක් පිහිටුවා ළමුන් ඇතුළත් කිරීමට පියවර ගන්නා ලද්දේ 2008/38 දරණ චක්‍ර ලේඛය හෝ වෙනත් චක්‍ර ලේඛයක් යටතේද යන්න විමසා සිටීමේදී වගඋත්තරකරුවන් දන්වා ඇත්තේ, එය නිවැරදිව කිව නොහැකි බවයි. පුවත්පත් දැන්වීම අනුව පෙනී යන්නේ දරුවන් ඇතුළත් කිරීමේ ක්‍රමවේදය අනුව අසාධාරණයක් ලක් වූ අවස්ථා ඇතොත් එවැනි පැමිණිලි ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දී ඇති බවයි. පෙත්සම්කාරියගේ දරුවා පාසලේ 2 වන ශ්‍රේණියට තෝරා ගත් ළමුන්ගේ ලැයිස්තුවට ඇතුලත් කර විදුහල්පති විසින් නිර්දේශයකට අමාත්‍යාංශයට යවා තිබූ බැවින් තමාට අසාධාරණයක් වී ඇති බව අනාවරණය නොවූ බැවින් අභියාචනයක් නැවත කිරීමේ අවශ්‍යතාවයක් පෙත්සම්කාරියට නොතිබූ බව පෙත්සම්කාරිය පෙන්වා දී ඇත.

**නිරීක්ෂණ :-**

03 වන වගඋත්තරකාර ශ්‍රී සුමංගල විද්‍යාලයේ විදුහල්පති විසින් 2015 වසරේ 2 වන ශ්‍රේණියේ පවතින පුරප්පාඩු කීපයක් සලකා බලා ඒ සඳහා තම දරුවන් ඇතුළත් කර ගන්නා ලෙස ඉල්ලා ඉදිරිපත් කරන ලද අයදුම්පත් 32 ක් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුසු අයදුම්කරුවන්ගේ දරුවන් හත්දෙනෙකුගේ නම් තෝරා ගෙන ඇති බව නිරීක්ෂණය වේ. එය 2008/38 දරණ චක්‍ර ලේඛයට අනුව නිත්‍යානුකූලව සිදුකර ඇති බව සනාථ වේ. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විශේෂ අභියාචනා කමිටුවක් පිහිටුවා පාසැල් වලට සිසුන් ඇතුළත් කිරීමේදී යම් අසාධාරණයට ලක් වූ අයදුම්කරුවන් සිටී නම් අභියාචනයක් ඉදිරිපත් කරන ලෙසද ප්‍රසිද්ධ පුවත්පත් මගින් දැන්වීමක් නිකුත් කර තිබී ඇත. එකී දැන්වීමට අනුව සලකා බලන බවට දක්වා ඇත්තේ පොදුවේ සමස්ථ පාසල් පද්ධතියම සඳහා පොදු නිවේදනයක් වන බවද නිරීක්ෂණය වේ. පෙත්සම්කාරියගේ දරුවා විදුහල්පති විසින් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය අනුව තෝරා ගන්නා ලද සිසුන් හත්දෙනාගේ නාම ලේඛනයට ඇතුළත්ව තිබූ බැවින් පෙත්සම්කාරියට ඉහත කී අභියාචනා කමිටුවට අභියාචනයක් කිරීමේ අවශ්‍යතාවයක් ඇති නොවන බව අනාවරණය වේ.

2008/38 දරණ චක්‍ර ලේඛය ප්‍රකාරව විදුහල්පති හට අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් බඳවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට හැකියාව ඇති බවත් පැහැදිලි වේ. තෝරා ගන්නා ලද සිසුන් බඳවා ගැනීමේ කටයුතු සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට 01 සහ 02 වගඋත්තරකරුවන්ට ඉදිරිපත් කළ පසු 01 සහ 02 වගඋත්තරකරුවන් විසින් ඉහත කී චක්‍ර ලේඛය තුළින් අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් බඳවා ගැනීමට ඇති බලතල ඉක්මවා විශේෂ අභියාචනා කමිටුවක් ඇති කර 01 සහ 02 වගඋත්තරකරුවන්ගේ අභිමතය භාවිතා කරමින් කටයුතු කර ඇති බව අනාවරණය වේ. තවද පෙත්සම්කාරියට එකී විශේෂ අභියාචනා කමිටුවට ඉදිරිපත් වීමට අවස්ථාවක් ලබා නොදී විශේෂ අභියාචනා කමිටුව විසින් ඔවුන් වෙත අයදුම්පත් ඉදිරිපත් කළ අයගේ ඉල්ලීම් පමණක් සලකා බලා ඇති අතර 03 වන වගඋත්තරකාර විද්‍යාලය විසින් සම්මුඛ පරීක්ෂණයක් මගින් පෙත්සම්කාරියගේ දරුවා තෝරා ගෙන තිබියදී ඒ පිළිබඳ සලකා බැලීමක් සිදු කර නැති අතර, අභියාචනා කමිටුවට පෙත්සම්කාරිය කැඳවා ඉදිරිපත් වීමට අවස්ථාවක් ලබාදී නොමැති බවද නිරීක්ෂණය වී ඇත.

**නිගමනය සහ නිර්දේශය :-**

01 සහ 02 වගඋත්තරකරුවන් විසින් විශේෂ අභියාචනා කමිටුවක් පත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන අසාධාරණයට ලක් වූ අයදුම්කරුවන් සම්බන්ධව කටයුතු කිරීමට සලකා බලන බව එකී පුවත්පත් දැන්වීමේ දක්වා තිබුණද 2008/38 දරණ චක්‍ර ලේඛය ප්‍රකාරව එවැනි විශේෂ අභියාචනා කමිටුවක් මගින් කටයුතු කිරීමේ අවශ්‍යතාවයක් සඳහා බලතල ලබාදී නොමැති බව අනාවරණය වී ඇත. කෙසේ වෙතත් විශේෂ අභියාචනා කමිටුව ඇති කර අසාධාරණයට ලක්වූ පාර්ශවයන් සඳහා නැවත සලකා බැලීමට අවස්ථාවක් ලබාදී තිබුණද පෙත්සම්කාරියට එකී කමිටුවට ඉදිරිපත් වීමට අවශ්‍යතාවයක් පැන නැගී ඇත්තේ 03 වන වගඋත්තරකරු විසින් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය අනුව තෝරා ගන්නා ලද සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගේ නිර්දේශිත නාම ලේඛනයේ පෙත්සම්කාරියගේ දරුවාගේ නම ඇතුළත්ව තිබී ඇති බැවින් එම අවස්ථාවේ අසාධාරණයක් සිදුව නැති බැවින් අභියාචනයක් කිරීමේ අවශ්‍යතාවයක්ද පැන නැගී නැති බැවිනි. එහෙත් එකී අභියාචනා කමිටුවේදී පෙත්සම්කාරියට ඉදිරිපත්ව කරුණු කියාපෑමට අවස්ථාවක් ලබා නොදී 03 වන වගඋත්තරකාර විද්‍යාලය විසින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වා තෝරා ගන්නා ලද දරුවාගේ නම අභියාචනා කමිටුව විසින් ඉවත් කර තිබීම මත පෙත්සම්කාරිය හට අසාධාරණ තත්වයක් උද්ගත වී තිබේ. 03 වන වගඋත්තරකාර විද්‍යාලය විසින් තෝරා ගන්නා ලද ළමුන්ගේ නාම ලේඛනය 01 සහ 02 වගඋත්තරකරුවන්ට යවා තිබී ඇති අතර, එය නොසලකා හැරීමට කටයුතු කරන්නේ නම් 01 සහ 02 වගඋත්තරකරුවන් සිදු කළයුතු වඩාත් උචිත කාරණාව වන්නේ තෝරා ගන්නා ලද ළමුන් ප්‍රතික්ෂේප කිරීමට සිදුව ඇති බැවින් විශේෂ අභියාචනා කමිටුවට ඉදිරිපත් වන ලෙස දන්වා එම පාර්ශවයන්ට කරුණු කියා පෑමට අවස්ථාවක් ලබාදී තීරණයක් ගැනීමයි. නමුත් එසේ සිදු නොකර එය නොසලකා හැර ඒකපාර්ශවීයව විශේෂ අභියාචනා කමිටුව කටයුතු කර

ඇති බව පෙත්සම්කාරියගේ කරුණු වලට අවධානය යොමු නොකිරීමෙන් තහවුරු වේ. එකී හේතු මත 01 වන සහ 02 වගඋත්තරකරුවන් කටයුතු කර ඇති ආකාරය අනුව ගන්නා ලද විධායක හා පරිපාලනමය ක්‍රියාවන් හේතුවෙන් පෙත්සම්කාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් ඇති වී තිබෙන බව අනාවරණය වේ. එය 1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය වීමක් වන අතර පෙත්සම්කාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී තිබීම වළක්වා ගැනීම සඳහා පෙත්සම්කාරියගේ දරුවා වන බිනුත් බාසිත කස්ත්‍රිආරච්චි යන අය 2015 වසරේ 2 ශ්‍රේණියට අදාළව බඳවා ගැනීම් ලේඛනයට ඇතුළත් කිරීමට සුදුසුකම් ලබා තිබූ බැවින් ඒ අනුව එකී ශ්‍රේණියට ඇතුළත්ව අධ්‍යාපන කටයුතු ලබා ගැනීමට ඇති අවස්ථාව අහිමි කර තිබීම මත 2016 වසරට අදාළව 3 ශ්‍රේණියේ අධ්‍යාපන කටයුතු ලබා ගැනීම සඳහා ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතු බව මින් දන්වා සිටිමු.

2016.02.07 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

HUMAN RIGHTS COMMISSION
OF SRI LANKA
CHAIRMAN
COMMISSIONERS